# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව

## ඇබෑර්තු

පහත සඳහන් විශේෂඥ වෛද්‍ය තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මනෝචිකිත්සක
2. පිළිකා රෝග විශේෂඥ
3. වාහිනික (Vascular) හා ඉන්ද්‍රිය බද්ධ විශේෂඥ
4. ළමා ශල්‍ය විශේෂඥ වෛද්‍ය
5. සායනික රුධිරවේද විශේෂඥ
6. ක්ෂුද්‍ර ජීව විද්‍යා විශේෂඥ
7. හෘද රෝග නිර්වින්දක වෛද්‍ය විශේෂඥ
8. අධිකරණ වෛද්‍ය නිලධාරී

**සුදුසුකම් :** රජයේ හෝ පෞද්ගලික රෝහල්වල විශේෂඥ වෛද්‍ය නිලධාරීන් විය යුතු අතර, කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (Pgim) එක් එක් විශේෂඥ කේන්ද්‍රයේ MD මණ්ඩල සහතිකකරණය ලබා තිබිය යුතුය.

**වයස** : අයදුම්කරුවන් අවුරුදු 50 ට අඩු විය යුතුය.

**වැටුප් පරිමාණය :** රුපියල් 118,800.00 - 12X3,645.00- 162,540.00 (මසකට)

එයට අමතරව, රාජ්‍ය අංශයේ ගෙවනු ලබන දීමනා සමග පාලක මණ්ඩලය විසින් අනුමත කළ අමතර දීමනාද හිමිවේ.

**සේවයේ යෙදවීමේ නියමයන් :** තනතුරු ස්ථිරවන අතර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාර අරමුදලට දායකත්වය හිමිවේ.

රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමුකළ යුතු අතර, ඍජු පිටපතක් එවිය යුතුය. මෙම තනතුරට අදාළ අයදුම්කරු තෝරාගත හොත්, දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණු සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානී වෙතින් ලබාගත් සහතිකයක් යා කොට තිබිය යුතුය.

මෙම තනතුරුවලට යම් අයවලුන් පත්කරන්නේද, නොකරන්නේද යන කරුණ සම්බන්ධව ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ පාලක මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

තම සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව සකස් කළ අයදුම්පත් ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ (02) නම් සහිතව පහත සඳහන් ලිපිනය වෙත 2024-08-26 දිනට පෙර ලැබීමට සැළැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව,**
**තලපත්පිටිය, නුගේගොඩ.**
**2024 අගෝස්තු 01.**

